# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1981 අංක 33 දරන මහ නගර සභා (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 1981 මැයි මස 29 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1981 ජූනි මස 05 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැක

මිළ : ශත 35 යි

තැපැල් ගාස්තුව : ශත 50 යි

1981 අංක 33 දරන මහ නගර සභා (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1981 මැයි මස 29 වන දින]

එල්. ඩී.—ඕ. 71/80

**මහ නගර සභා ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

**1.** මේ පනත 1981 අංක 33 දරන මහ නගර සභා (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. කෙටි නාමය.

**2.** මහ නගර සභා ආඥාපනතේ 327 වන වගන්තියේ (1) වන උපවගන්තියෙහි "වාර්ෂික වටිනාකම" යන අර්ථ කථනය වෙනුවට, පහත දැක්වෙන අර්ථ කථනය ආදේශ කිරීමෙන්, ඒ වගන්තිය, මෙයින් සංශෝධනය කරනු ලැබේ :— 252 වන අධිකාරයේ 327 වන වගන්තිය සංශෝධනය කිරීම.

' "වාර්ෂික වටිනාකම" යන්නෙන්—

(අ) යම් ස්ථානයක් කුලියට දී නොමැති අවස්ථාවක, සියලු පොදු වරිපනම් හා බදු ගෙවීමට කුලී නිවැසියා විසින් භාරගනු ලැබුවේ නම් හා ඒ ගෙවල් කුලිය අයකර ගැනීමට තරම් යෝග්‍ය තත්ත්වයකින් යම් නිවාසයක්, ගොඩනැගිල්ලක්, ඉඩමක් හෝ ගෙපතක් පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය වන්නා වූ අළුත්වැඩියා කිරීම්, නඩත්තු කිරීම හා යථා තත්ත්වයෙන් පවත්වා ගෙන යාම සඳහා පිරිවැයක් වේනොත්, එය දැරීමේ වගකීම ගෙහිමියා විසින් භාරගනු ලැබුවේ නම්, එක් වර්ෂයක් තවත් වර්ෂයක් අනුව සලකා බලන විට, ඒ නිවාසය, ගොඩනැගිල්ල, ඉඩම හෝ ගෙපත සඳහා යම් කුලී නිවැසියකු විසින් ගෙවීමට යුක්ති සහගත ලෙස බලාපොරොත්තු වන්නා වූ වාර්ෂික ගෙවල් කුලිය ද ;

(ආ) යම් ස්ථානයක් කුලියට දී ඇති අවස්ථාවක, සියලු පොදු වරිපනම් හා බදු ගෙවීමේ වගකීම කුලී නිවැසියකු විසින් භාරගනු ලැබුවේ නම් හා ඒ ගෙවල් කුලිය අයකර ගැනීමට තරම් යෝග්‍ය තත්ත්වයකින් යම් නිවාසයක්, ගොඩනැගිල්ලක්, ඉඩමක් හෝ ගෙපතක් පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය වන්නා වූ අළුත්වැඩියා කිරීම්, නඩත්තු කිරීම හා යථා තත්ත්වයෙන් පවත්වා ගෙන යාම සඳහා පිරිවැයක් වේනොත්, එය දැරීමේ වගකීම ගෙහිමියා විසින් භාරගනු ලැබුවේ නම්, එක් වර්ෂයක් තවත් වර්ෂයක් අනුව සලකා බලන විට, ඒ කුලී නිවැසියා විසින් ඒ නිවාසය, ගොඩනැගිල්ල, ඉඩම හෝ ගෙපත සඳහා ගෙවීමට යුක්ති සහගත ලෙස බලාපොරොත්තු වන්නා වූ වාර්ෂික ගෙවල් කුලිය නැතහොත් පොදු වරිපනම් හා බදු ගෙවීමේ

2—ජේ 55501—11,800 (81/07)

වගකීම කුලී නිවැසියා විසින් භාරගනු ලැබූ අවස්ථාවක සහ ඒ ගෙවල් කුලිය අයකර ගැනීමට තරම් යෝග්‍ය තත්ත්වයකින් ඒ නිවාසය. ගොඩනැගිල්ල, ඉඩම හෝ ගෙපත පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය මත්නා වූ අළුත්වැඩියා කිරීම්, නඩත්තු කිරීම හා යථා තත්ත්වයෙන් පවත්වා ගෙන යාම සඳහා පිරිවැයක් වේනොත්, එය දැරීමේ වගකීම ගෙහිමියා විසින් භාරගනු ලැබූ අවස්ථාවක, ගෙවන ලද නියම වාර්ෂික ගෙවල් කුලිය යන දෙකින් වැඩි ගෙවල් කුලිය ද අදහස් වේ:

එසේ වුව ද වාර්ෂික වටිනාකම් ආගණනය කිරීමේ දී කුලියට නොදුන් කවර වූ හෝ යම් කාලපරිච්ඡේදයක් සඳහා කිසිදු සහනයක් හෝ අඩුකිරීමක් කරනු නොලැබිය යුතු ය;'.

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත්වල සහ නීතිවල වාර්ෂික දායක මිල (දේශීය) රු. 30 කි. (විදේශීය) රු. 40 කි. කොළඹ 1, තැ. පෙ. 500, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.